Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

සතිය - I

09 ශ්‍රේණිය

Prepared by- නිවිතිගල අධ්‍යාපන කලාපය

**අභ්‍යාසය**

- තොරතුරු පත්‍රිකාව ඇසුරින් පහත සඳහන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. නාට්‍ය තේමාවක් යනු කුමක්ද?
2. ඔබ දන්නා වේදිකා නාට්‍ය 2 ක නාට්‍ය තේමා ලියා දක්වන්න.
3. පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන චරිත, නාට්‍යෝචිත අවස්ථා ගොඩනඟමින් සංවාද රචනා කරමින් තේමාව ඉස්මතු වන පරිදි කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

✓ උත්සහ වන්තයා ජය ගනී

✓ සිත ඇත්නම් පත කුඩා ද.

✓ සිටියොත් හොඳට හැදී දෙවියොත් නමට වදී

✓ දුප්පත්කම දියුණුවට බාධාවක් නොවේ.

✓ අභියෝග හමුවේ නොසැලී සිටීමෙන් ජීවිතය ජය ගත හැකිය.

✓ මව්පිය සෙනහස අසීමිතය.

**තොරතුරු පත්‍රිකාව**

නාට්‍ය තේමාව යනු යම්කිසි නාට්‍යයක් මඟින් සමාජයට ලබා දීමට අපේක්ෂිත පණිවිඩයයි.

උදා:- කදා වළලු නාට්‍යයේ තේමාව වන්නේ අධික තණ්හාවෙන් කටයුතු කිරීමත් ස්ථානෝචිත ප්‍රඥාය නොමැති වීමත් පුද්ගල විනාශයට හේතු වේ. යන්නයි. (සේරිවාණිජ ජාතක කතාව ඇසුරින් මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍ර මහාතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයකි.

හෙන්රි ජයසේනයන්ගේ හුණුවටයේ කතාව නාටයයේ තේමාව සුදුස්සාට සුදුසු දේ ලැබිය යුතු යන්නයි.

පෙළ රචකයා තම නාට්‍ය රචනයට පෙර නාට්‍යයේ එන කතාවෙන් සමාජයට දීමට අපේක්ෂිත පණිවිඩය මනා ලෙස අවබෝධ කර ගත යුතුය.ඒ අනුව නාට්‍ය පෙළක් රචනා කිරීමට පරිකල්පන ශක්තිය බෙහෙවින් අත්‍යාවශ්‍ය වේ.

අධ්‍යක්ෂවරයා විසින් නළු නිළියන් යොදවා තම නාට්‍ය ඔස්සේ නාට්‍යයේ තේමාව ප්‍රේක්ෂකයා වෙත ගෙන එනු ලැබේ.නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයාට මනා ලෙස තේමාව අවබෝධ කරගත හැකි පරිද්දෙන් නාට්‍ය නිර්මාණය කළ යුතු වේ. නාට්‍ය තේමාව ප්‍රේක්ෂකයා වෙත ගෙන යාමට ඉතා ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා සහිත නාට්‍ය පෙළක් තිබිය යුතුය.

සැකසුම :- කේ.එම්.චතුරිකා ප්‍රියදර්ශනී

ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය.